සියළු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

**ගම්පහ අධ්‍යාපන කලාපය**
Gampaha Education Zone

**දෙවන වාර ඇගයීම - 2025**
Second Term Evaluation - 2025

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 9 | විෂයය Subiect: ඉතිහාසය | කාලය Time: පැය 02 |

## I කොටස

- **I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.**
- **II කොටසට පිළිතුරු වෙනම කඩදාසියක ලියා අමුණන්න.**
- **අංක 1 සිට 20 දක්වා ඇති ප්‍රශ්න වලට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. පෘතුගීසීන් මෙරටින් නෙරපා හැරීමට ලන්දේසින්ගේ සහය ලබාගත් රජතුමා කවුද?
(1). ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා ය. (2). පළමුවන විමලධර්මසූරිය රජතුමා ය.
(3). දෙවන රාජසිංහ රජතුමා ය. (4). පළමුවන රාජසිංහ රජතුමා ය.

02. ලන්දේසින්ගේ පෙරදිග පාලන මූලස්ථානය වූයේ,
(1). බතාවිය (2). මදුරාසිය (3). කල්කටා (4). කැලිකට්

03. පළමුවන විමලධර්මසූරිය රජු ඉදිරියේ රජුට අගෞරව වන ලෙස කථා කිරීම හේතුවෙන් අවාසනාවන්ත ලෙස මරණයට පත් වූයේ,
(1). ස්පිල්බර්ජන් (2). ෆන් එංගල්බෙක්
(3). වෙස්ටර් වෝල්ඩ් (4). සිබෙල් ද වර්ට්

04. 1638 දී අත්සන් තබන ලද ගිවිසුම සම්බන්ධ උඩරට රජතුමා වන්නේ,
(1). සෙනරත් රජතුමා (2). දෙවන රාජසිංහ රජතුමා
(3). රාජාධි රාජසිංහ රජතුමා (4). දෙවන විමලධර්මසූරිය රජතුමා

05. ලන්දේසීන්ගේ පාලන සංවිධානයේ ඉහළින්ම සිටියේ,
(1). VOC සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය (2). බතාවියේ ආණ්ඩුකරු
(3). ලංකාවේ ආණ්ඩුකරු (4). කොමදෝරුවරු

06. පහත නඩු විසඳු අධිකරණ දෙක පිළිවෙළින් සඳහන් පිළිතුර වන්නේ,
✷ අපරාධ නඩු විසඳීම
✷ විවාහ සම්බන්ධ නඩු විසඳීම
(1). මහාධිකරණය, ඉඩම් උසාවිය (2). ගම්පති උසාවිය, පිස්කල් උසාවිය
(3). මහාධිකරණය, සිවිල් උසාවිය (4). සිවිල් උසාවිය, ඉඩම් උසාවිය

07. ලන්දේසි ජාතිකයන් නිසා මෙරටට එක්වූ ජනවර්ගය වූයේ,
(1). මැලේ (2). බර්ගර් (3). මුස්ලිම් (4). දමිළ

08. ඉංග්‍රීසීන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශය පමණක් පාලනය කළ කාල වකවානුව වන්නේ,
(1). 1796-1815 (2). 1815-1948 (3). 1796-1948 (4). 1802-1848

09. මෙරටට පැමිණි ප්‍රථම ඉංග්‍රීසි ජාතිකයා නම්,

(1). ස්ටීල් බර්ජන් (2). හියුබොයිඩ්

(3). ෆෙඩ්රික් නෝර්ත් (4). ජෝන් ෆයිබස්

10. 1797 මුහුදුබඩ ප්‍රදේශයේ කැරැල්ලට හේතු වූ නව බදු වර්ගයක් නොවන්නේ,

(1). තුවක්කු බද්ද (2). ලුණු බද්ද (3). පොල් ගස් බද්ද (4). මාළු බද්ද

11. ✷ ලංකාවේ ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකරුවීම

✷ 1803 දී උඩරට රාජධානිය ආක්‍රමණය කිරීම.

යන සිද්ධීන් හා සම්බන්ධ ආණ්ඩුකරු වන්නේ,

(1). තෝමස් මේට්ලන්ඩ් (2). රොබට් බ්‍රවුන්රිග්

(3). ෆෙඩ්රික් නෝර්ත් (4). ටොරින්ටන් සාමි

12. 1815 දී උඩරට ගිවිසුම අත්සන් තබන විට බ්‍රිතාන්‍යයේ සිටි පාලකයා වූයේ,

(1). V වන විලියම් රජු (2). III වන ජෝර්ජ් රජු

(3). II වන පිලිප් රජු (4). II වන විලියම් රජු

13. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ බිසවුන් වහන්සේ වූයේ,

(1). කුසුමාසන දේවිය (2). ඇහැළේපොළ කුමාරි

(3). සුනේත්‍රා දේවි (4). රංගම්මා දේවිය

14. දෙවන නිදහස් අරගලයට සම්බන්ධ පුරෝගාමීන් අතරින් කසපහර දී රටින් පිටුවහල් කළ නායකයා වන්නේ,

(1). පුරන්අප්පු (2). ගොංගාලේගොඩ බණ්ඩා

(3). ඩිංගිරාල (4). දීනිස්

15. බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට ආදායම පහළගොස් වියදම ඉහළයාම පිළිබඳ සොයා බැලීමට එවි කොමිසම නම්,

(1). ඩොනමෝර් කොමිසම (2). සෝල්බරි කොමිසම

(3). කෝල්බෲක් කොමිසම (4). මියුරන් කොමිසම

16. ඉංග්‍රීසීන් මෙරට වගා කළ ප්‍රථම ආර්ථික බෝගය නම්,

(1). තේ (2). කුරුඳු (3). රබර් (4). කෝපි

17. ශ්‍රී ලංකාවේ තේ පර්යේෂණාගාරය පිහිටා ඇත්තේ,

(1). තලවකැලේ (2). අගලවත්ත (3). ලුණුවිල (4). මාතලේ

18. පානදුරාවාදයේ පුරෝගාමී භික්ෂූන් වහන්සේ වන්නේ,

(1). හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි (2). මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

(3). වලානේ සිද්ධාර්ථ හිමි (4). රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමි

19. ඉන්දියානු ජාතික සංගමයේ ප්‍රථම සභාපති වූයේ,

(1). සුරේන්ද්‍රනාත් බැනර්ජි (2). මහත්මා ගාන්ධි

(3). දඩාබායි නඖරෝජි (4). ඩබ්ලිව්.සී. බෙනර්ජි

20. අවිහිංසාවාදී සටන් ව්‍යාපාරයක් සමස්ත භාරතය පුරා ව්‍යාප්ත කරමින් ඉන්දියාවට නිදහස ලබා ගැනීමට කටයුතු කළ නායකයා,

(1). ජවහර්ලාල් නේරු (2). බාල් ගංගාධාර් තිලක්

(3). මහත්මා ගාන්ධි (4). මොහොමඩ් අලි ජින්නා

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **අනෙකුත් ප්‍රශ්න අතරින් හතරක් තෝරාගෙන පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

01. (i). දී ඇති ශ්‍රී ලංකා සිතියමේ A, B, C, D අක්ෂර වලින් දැක්වෙන ස්ථාන හඳුනාගෙන එම ස්ථාන නම් කරන්න.




(ii). ලෝක සිතියමේ A, B, C, D අක්ෂර වලින් දැක්වෙන ස්ථාන හඳුනාගෙන එම ස්ථාන නම් කරන්න. (ල.04)



(iii). (A) මෙම රූපයේ දැක්වෙන්නේ කවුරුන්ද ?

(B) මෙතුමා අයත් රාජධානිය කුමක්ද ?

(C) මෙතුමා නායකත්වය දුන් නිදහස් සටන ලියන්න.

(D) මෙතුමා සටන් කරන ලද්දේ කුමන ජාතියකට එරෙහිවද ?

(ල.4)



(iv). (A) මෙම රූපයේ සිටින්නේ කවුද ?

(B) මෙතුමාගේ මුල් නාමය ලියන්න.

(C) පැවිදිවීමෙන් පසු මෙතුමාගේ නම කුමක්ද ?

(C) මෙතුමා ආරම්භ කළ පුවත්පත කුමක්ද ?

(ල.4)



02. (i). පෘතුගීසි ජාතිකයන්ගේ, ලන්දේසි ජාතිකයන්ගේ ආගම් දෙක පිළිවෙලින් ලියන්න. (ල.2)

(ii). ලන්දේසි ජාතිකයන් නිසා සිංහල භාෂාවට එකතු වූ වචන 02 බැගින් පහත අංග යටතේ ලියන්න.

ගෘහ නිර්මාණ -

උසාවි - (ල.4)

(iii). ලන්දේසීන් මෙරට කුරුඳු වෙළඳාමෙන් උපරිම ලාභ ලබා ගැනීමට ක්‍රියා කළ ආකාරය කරුණු තුනක් ලියා එකක් විස්තර කරන්න. (ල.5)

03. (i). ඉංග්‍රීසීන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ල.2)

(ii). (a). 1796 ට පෙර උඩරට රාජ්‍ය සමඟ දූත ගමන් පැවැත්වූ ඉංග්‍රීසි ජාතිකයන් දෙදෙනෙක් ලියන්න.

(a). ඉංග්‍රීසීන් උඩරට ආක්‍රමණය කළ වර්ෂ දෙක ලියන්න.

(ල.4)

(iii). 1815 දී ඉංග්‍රීසි ජාතිකයන්ට උඩරට රාජධානිය පහසුවෙන් යටත් කර ගැනීමට හැකි වූ හේතු තුනක් ලියා එකක් විස්තර කරන්න. (ල.5)

04. (i). 1815 උඩරට ගිවිසුමට අත්සන් තබන ලද රදළ ප්‍රධානීන් දෙදෙනෙක් ලියන්න. (ල.2)

(ii). දෙවන නිදහස් අරගලයට බලපෑ හේතු දෙකක් ලියන්න. (ල.4)

(iii). පළමු නිදහස් අරගලයේ ප්‍රතිඵල තුනක් ලියා එකක් විස්තර කරන්න. (ල.5)

05. (i). මෙරටට තේ වගාව හා කෝපි වගාව හඳුන්වා දුන් පුද්ගලයින් පිළිවෙලින් ලියන්න. (ල.2)

(ii). ආර්ථික බෝග වර්ග දෙකක් වූ පොල් හා රබර් වගා කරනු ලබන දිස්ත්‍රික්ක දෙක බැගින් ලියන්න. (ල.4)

(iii). තේ වගාවේ දියුණුවට බලපෑ හේතු තුනක් ලියා එකක් විස්තර කරන්න. (ල.5)

06. (i). බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරටට පැමිණි මිෂනාරි සංවිධාන දෙකක් ලියන්න. (ල.2)

(ii). අසා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු පහත වරහන තුළ දී ඇති පිළිතුරු අතරින් තෝරා ලියන්න.

(a) මිෂනාරින් සිය ආගම ප්‍රචාරය කිරීමට මුද්‍රණය කරන ලද පොතකි.

(b) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි පිහිට වූ පිරිවෙන

(c) ඉරුදින දහම් පාසල් ආරම්භ කිරීම.

(d) නටබුන් වී ගිය බෞද්ධ පූජනීය ස්ථාන ආරක්ෂා කර ගැනීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීම.

(ඕල්කට් තුමා, විද්‍යෝදය පිරිවෙන, වලිසිංහ හරිස්චන්ද්‍ර, ලංකා නිධානය, විද්‍යාලංකාර පිරිවෙන, අනගාරික ධර්මපාලතුමා, ලක්මිණි පහන)

(ල.4)

(iii). පහත දී ඇති පුද්ගලයින් අතරින් දෙදෙනෙකු පිළිබඳව වෙන වෙනම විස්තරයක් ලියන්න.

(a) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා

(b) අනගාරික ධර්මපාලතුමා

(c) ආරුමුග නාවලර් තුමා (ල.5)

07. (i). (a). ඉන්දියාවේ සම්භාවනීය මහල්ලා යන අන්වර්ථ නාමයෙන් හැඳින්වූයේ කවුරුන්ද ?

(b). ලෝකප්‍රකට ටජ්මහල නිර්මාණය කළ රජතුමා කවුද ? (ල.2)

(ii). පහත වරහන තුළ දී ඇති පුද්ගලයින්ගෙන් මධ්‍යස්ථ මතධාරීන් දෙදෙනෙක් හා අන්තවාදීන් දෙදෙනෙකු තෝරා වෙන වෙනම ලියන්න.

(බහදුර්ෂා, ඩබ්.සී. බෙනර්ජි, බිපන් චන්ද්‍රපාල්, ලාල් ලජ්ජත්රායි, දඩාබායි නබරෝජි)

(ල.4)

(iii). මහත්මා ගාන්ධි තුමා ඉන්දියාවට නිදහස ලබා ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග තුනක් ලියා එකක් විස්තර කරන්න. (ල.5)